## ශ්‍රී ලංකා මහ බැංකුව - 2017

--------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.1 මතය

--------

2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, මූල්‍ය ප්‍රකාශන සටහන් සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති ඇතුළත් සාරාංශයකින් සමන්විත ශ්‍රී ලංකා මහ බැංකුවේ ("බැංකුව") මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා මුදල් නීති පනතේ 42(2) වගන්තිය (422 අධිකාරිය) සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනය කරගෙන යාමේදී, ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලවීම පරීක්ෂා කිරීම සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහාය විය.

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ සියලු ප්‍රමාණාත්මක කරුණුවලින් සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (IFRS) අනුකූලව සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

------------------------

මා විසින් ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISA) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. එම ප්‍රමිතීන් යටතේ මාගේ වගකීම් මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම් කොටසේ තවදුරටත් විස්තර කරනු ලැබේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආචාර ධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළවන ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට අනුකූලව බැංකුව කෙරෙහි මම ස්වාධීන වන අතර, එම අවශ්‍යතාවයන්ට අනුකූලවන පරිදි මාගේ වෙනත් ආචාරධර්ම වගකීම් මා විසින් සම්පූර්ණ කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මුදල් මණ්ඩලයේ වගකීම

--------------------------------

මූල්‍ය ප්‍රකාශන ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම මුදල් මණ්ඩලයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්මෙන් යුතුව පවත්වා ගැනීම සඳහා අඛණ්ඩ පැවැත්මට අදාළවන කරුණු අදාළ වන පරිදි හෙළිදරව් කිරීම සහ ගිණුම්කරණයේ අඛණ්ඩ පැවැත්ම පදනම යොදාගනිමින් පවත්වා ගැනීම සඳහා බැංකුවේ හැකියාව ඇගයීම සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය වගකිව යුතු වේ.

බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම පාලනයට යටත් අයගේ වගකීම වේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශන වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන බවට සාධාරණ තහවුරුවක් ලබාගැනීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාවක් නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරන තහවුරුවක් යන්න,ඉහල මට්ටමේ,තහවුරුවක් වන නමුත් ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISA) අනුකූලව විගණනයන් ක්‍රියාත්මක කිරීමේදී සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගැනීම සඳහා තහවුරුවක් නොවේ. සාවද්‍ය ප්‍රකාශන වංචා හෝ වැරදි හේතුවෙන් පැන නැගිය හැකි අතර එය තනිකර හෝ සමස්තයක් ලෙස ගත්කල ප්‍රමාණාත්මක ලෙස සැලකේ නම්, භාවිතා කරන්නන්ට මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්ව ආර්ථික තීරණ ගැනීම සඳහා බලපානු ලබන බවට සාධාරණව අපේක්ෂා කළ හැකිය.

ජාත්‍යන්තර විගණන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව විගණනයේ කොටසක් ලෙස සමස්ත විගණනය තුළ මා විසින් වෘත්තීය විනිශ්වය සහ වෘත්තිය විචක්ෂණභාවය පවත්වා ගෙන යන ලදී. එසේම මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි මූල්‍ය ප්‍රකාශන පිළිබඳ ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ එම අවදානම්වලට ප්‍රතිචාර දක්වන විගණන පරිපාටි සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සහ මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ප්‍රමාණාත්මක සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීම. වංචාවල ප්‍රතිඵලයක් ලෙස ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් සොයා නොගැනීම වැරදි එළිදරව් නොකිරීමට වඩා වැඩි අවදානමකට හේතු වන අතර දුස්සන්ධානය, කූට රචනය, අභිප්‍රායික අත්හැරීම්, වරදවා දැක්වීම් හෝ අභ්‍යන්තර පාලනය අක්‍රීය කරන වංචා, මෙයට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විගණනයට අදාළවන අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා නමුත් බැංකුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකෙරේ.
- යොදාගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල අදාළත්වය හා ගිණුම්කරණ ඇස්තමේන්තු සහ මුදල් මණ්ඩලය විසින් කරන ලද අදාළ හෙළිදරව් කිරීම පිළිබඳ සාධාරණත්වය ඇගයීම.
- අඛණ්ඩ පැවැත්ම පදනම් කරගත් ගිණුම්කරණය පිළිබඳ මුදල් මණ්ඩලයේ යොදාගැනීම පිළිබඳ අදාළත්වය නිගමනය කිරීම සහ ලබාගත් විගණන සාක්ෂි පදනම් කරගෙන, අඛණ්ඩ පැවැත්මක් සහිතව පවත්වා ගෙන යාමට බැංකුවේ හැකියාව පිළිබඳ සැලකිය යුතු සැකයකට හේතුවන සිද්ධිවලට හෝ කරුණුවලට අදාළවන ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින්නේද යන්න නිගමනය කිරීම. ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින බවට මා විසින් නිගමනය කෙරේ නම් හෝ මාගේ මතය විකරණය කිරීම සඳහා එම හෙළිදරව් කිරීම් ප්‍රමාණාත්මක නොවේ නම් මූල්‍ය ප්‍රකාශනවල අදාළ හෙළිදරව් කිරීම් පිළිබඳ මාගේ විගණන වාර්තාවට අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මාගේ නිගමනයන්ට පදනම් වේ. කෙසේ වුවද අනාගත සිද්ධි හෝ තත්වයන් බැංකුවේ අඛණ්ඩ පැවැත්ම නතර කිරීමට හේතු විය හැක.
- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම ව්‍යුහය හා අන්තර්ගතය ඇගයීම සහ සාධාරණ ඉදිරිපත් කිරීම ඉටු කරගැනීමට පාදක වූ ගනුදෙනු හා සිද්ධි මූල්‍ය ප්‍රකාශනවලින් නියෝජනය වේද යන්න ඇගයීම.

මාගේ විගණනයේදී හඳුනාගත් අනෙකුත් කරුණු අතර සැලසුම් කරන ලද විෂය පථය, විගණනයේ කාලය සහ අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු යම් අඩුපාඩු ඇතුළත් සැලකිය යුතු සොයාගැනීම් සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය වෙත මා විසින් සන්නිවේදනය කරනු ලැබේ.

## 2. නීති, රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

2016 අප්‍රේල් **29** දිනැති අංක 03/**2016** දරණ රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය ප්‍රකාරව බැංකුවේ සේවකයින්ගෙන් අයකර ගැනීම වෙනුවට, ස්වකීය අරමුදල් වලින් උපයන විට ගෙවීම් බදු (**PAYE**) සහ බදු මත බදු ලෙස එකතුව රු. මිලියන **355** ක් සහ රු. මිලියන 363 ක් පිළිවෙළින් සමාලෝචිත වර්ෂය සඳහා සහ පසුගිය වර්ෂය සඳහා බැංකුව විසින් ගෙවා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන්ට අනුව සමාලෝචිත වර්ෂයේ බැංකුවේ මෙහෙයුම් ප්‍රතිඵලය එනම් බදු පෙර ශුද්ධ ලාභය රු. මිලියන 50,**194** ක් වූ අතර පසුගිය වසරේ බදු පෙර ශුද්ධ ලාභය රු. මිලියන 24,**014** ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු. මිලියන 26,180 ක වර්ධනයක් පිළිබිඹු විය. විශේෂයෙන් උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනය ලාභ රු. මිලියන 14,261 කින් සහ විදේශ විනිමය මූල්‍ය වත්කම් වලින් ලද පොලී ආදායම රු. මිලියන 8,045 කින් වර්ධනය වීම මෙම මූල්‍ය ප්‍රතිඵලවල වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 3.2 විශ්ලේෂණාත්මක මූල්‍ය සමාලෝචනය

පසුගිය වර්ෂයේ සමස්ථ ශුද්ධ මෙහෙයුම් ආදායම වූ රු. බිලියන 36 (ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන අලාභය රු. බිලියන 6.8 ත් ඇතුළත්ව) හා සැසඳීමේ දී ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන අලාභය වූ රු. බිලියන 3.8 ත් ඇතුළත්ව සමාලෝචිත වර්ෂයේ දී බැංකුවේ ශුද්ධ මෙහෙයුම් ආදායම රු. බිලියන 60.6 ක් වූයෙන් සමස්ථ ශුද්ධ මෙහෙයුම් ආදායමේ ආදායමෙන් සියයට 68 ක වර්ධනයක් පිළිබිඹු විය. මේ අතර, ක්ෂයවීම් හා ක්‍රමක්ෂයවීම් ඇතුළුව මෙහෙයුම් වියදම් පසුගිය වර්ෂයේ දී රු. බිලියන 12 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ දී එය රු. බිලියන 10.4 ක් වීමෙන් මෙහෙයුම් වියදම්වල සියයට 13.3 ක අඩුවීමක් පිළිබිඹු විය. සමාලෝචිත වර්ෂය තුළ බැංකුවේ ආදායම් සහ වියදම්වල වෙනස්වීම් පෙර වර්ෂයට සාපේක්ෂව පහත සඳහන් වේ.

| | **2017** | **2016** | විචලනය {හිතකර/(අහිතකර)} | |
|---|---|---|---|---|
| | රු. බිලියන | රු. බිලියන | රු. බිලියන | ප්‍රතිශතය |
| **විදේශ විනිමය මූල්‍ය වත්කම් වලින් ලද ආදායම** | **49.7** | **26.4** | **23.3** | **88.3** |
| පොලී ආදායම | 22.9 | **14.9** | 8 | 53.7 |
| උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණන (ලාභය / (අලාභය) | 24.0 | **9.7** | 14.3 | 147.4 |
| උපලබ්ධි මිල වෙනස්වීම් වලින් වූ ලාභ | 2.8 | 1.8 | 1 | 55.6 |
| **විදේශ විනිමය මූල්‍ය වගකීම් මත වියදම්** | **3.0** | **3.9** | **0.9** | **23.1** |
| පොලී වියදම් | 3.0 | 3.9 | 0.9 | 23.1 |
| **ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභ / (අලාභ)** | **(3.8)** | **(6.8)** | **3** | **44.1** |

| | | | | |
|---|---|---|---|---|
| **දේශීය විනිමය වත්කම්වලින් ලද සමස්ථ ශුද්ධ ආදායම / (වියදම)** | **16.1** | **18.8** | **(2.7)** | **(14.4)** |
| **වෙනත් ආදායම්** | **1.6** | **1.5** | **0.1** | **6.7** |
| **මෙහෙයුම් වියදම්** | **10.4** | **12** | **1.6** | **13.3** |
| **රඳවා ගැනීමේ බදු** | **1.8** | **1.8** | **0** | **0.0** |
| **වර්ෂයේ බදු පසු ශුද්ධ ලාභ / (අලාභ )** | **48.4** | **22.2** | **26.2** | **118.0** |

විදේශ විනිමය මූල්‍ය වත්කම් වලින් ලද ආදායම පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 88.3 කින් ඉහළ ගොස් තිබූ අතර දේශීය විනිමය මූල්‍ය වත්කම් වලින් ලද ආදායම සියයට 14.4 කින් අඩු වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**----------------------------**

**4.1 කාර්යසාධනය**

**-----------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) කාසි එකතු කිරීම සහ බෙදා හැරීම සඳහා නව යාන්ත්‍රණයක්** සංවර්ධනය කිරීම

උපාය මාර්ගික සැලැස්ම (**2016-2018**) අනුව, **2015** නොවැම්බර් **24** දින පවත්වන ලද රැස්වීමේදී මුදල් මණ්ඩලය විසින් ලබා දී ඇති උපදෙස් අනුව **2016** මාර්තු **23** වන දින බැංකුවේ කාසි එකතුකිරීමේ ක්‍රියාවලිය සඳහා පහසුකම් සලසාගැනීමට මුදල් එකතුකිරීමේ සමාගම් වලින් කැමැත්ත ප්‍රකාශ කිරීම් (**Expressions of Interest -EOI**) කැඳවා තිබුණි. සමාගම් පහකින් ලද **EOIs** ඇගයීමෙන් අනතුරුව සමාගම් විසින් ලබා ගතයුතු අවම ලකුණු ලබා නොගැනීම නිසා එම **EOIs** ප්‍රතික්ෂේප කිරීමට ඇගයීම් කමිටුව තීරණය කර තිබුණි. ඒ අනුව, බැංකුව විසින් කාසි බෙදා හැරීම හැර දිවයින පුරා කාසි එකතුකිරීම සඳහා නව යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීම සඳහා වන උපාය මාර්ගික පියවරක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීමේ වැඩ සටහන

ආර්ථිකයේ වැඩෙන ඉල්ලුමට සරිලන පරිදි අභ්‍යන්තර හා බාහිර කම්පනයන් සඳහා ඔරොත්තු දීමේ හැකියාව වැඩි කරන ශක්තිමත් බැංකු / බැංකු නොවන මූල්‍ය ආයතන අංශයක් සංවර්ධනය කිරීමේ අරමුණින් **2014** ජනවාරි **17** වන දින මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීම සඳහා බැංකුව විසින් ප්‍රධාන සැලැස්ම එළිදැක්විණි. ඒ අනුව, 2017 අප්‍රේල් 30 වන දිනට රු. මිලියන 68 ක් වැය කරමින් බැංකු, මුදල් සමාගම් හා කල්බදු සමාගම් ඇතුළු ආයතන 17 ක් සමග වූ ඒකාබද්ධ කිරීමේ සැලසුම් සම්පූර්ණ කර තිබුණි. කෙසේ වෙතත්, 2018 අප්‍රේල් මාසය අවසන් වන විටත් ආයතන 16 ක් සමග වූ ඒකාබද්ධ කිරීමේ සැලසුම් සම්පූර්ණ කර නොතිබුණු අතර මේ සම්බන්ධයෙන් රු. මිලියන 59 ක මුදලක් බැංකුව විසින් වැය කර තිබුණි. ඉහත වියදම් වලට අමතරව, ඉහත ඒකාබද්ධ කිරීමේ සැලසුම්වල ඇතුළත් නොවූ ආයතන **20** ක් සම්බන්ධව තොරතුරු ලියවිල්ල, නිසි විශ්ලේෂණ හා තක්සේරු වාර්තා පිළියෙල කිරීම සහ අනෙකුත් කරණා සඳහා බැංකුව විසින් රු. මිලියන **59** ක් වැය කර තිබුණි.

(ඇ) **මුදල් සමාගම් නියාමනය සහ අධීක්ෂණය**

බැංකුවේ මුදල් මණ්ඩලය විසින් 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතට අනුව මුදල් සමාගම් නියාමනය සහ අධීක්ෂණය සිදු කරනු ලබයි. මුදල් ව්‍යාපාර පනතේ වගන්ති අංක 12 (1) ප්‍රකාරව මුදල් සමාගම්වල ව්‍යාපාර සහ ආයතනික කටයුතුවල යම් අංගයක් පවත්වාගෙන යාම සඳහා මුදල් මණ්ඩලය විසින් මුදල් සමාගම්වලට විධානයන් දෙනු ලැබිය හැකිය. කෙසේවෙතත්, මුදල් ව්‍යාපාර පනතේ වගන්ති අංක 12 (1) යටතේ දක්වා ඇති පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් කිසිදු විධානයක් 2018 අප්‍රේල් මාසය අවසාන වනවිටත් නිකුත් කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

| උප වගන්ති අංකය | කාරණය |
| --- | --- |
| ආ | - ඒ සමාගම් විසින් ප්‍රදානය කරනු ලබන ණය, ණය පහසුකම් හෝ වෙනත් වර්ගයකට අයත් මූල්‍ය පහසුකම් මත අයකරනු ලැබිය හැකි උපරිම පොළී අනුපාතික.<br>- ඒ ණය, ණය පහසුකම් හෝ වෙනත් වර්ගයකට අයත් මූල්‍ය පහසුකම් ප්‍රදානය කරනු ලැබිය හැකි උපරිම කාලසීමාව. |
| ඒ | තැන්පත්කරුවන් විසින් කල්පිරීමට පෙර තැන්පතු ආපසු ගැනීමට අදාළ විය යුතු කොන්දේසි. |
| ඕ | ඒ සමාගම් විසින් කරනු ලබන හෝ ප්‍රදානය කරනු ලබන යම් ණය, ආයෝජන හෝ මූල්‍ය පහසුකම් නිශ්චිත කාලසීමා ඇතුළත වැඩි කරනු ලැබිය හැකි සීඝ්‍රතාව පිළිබඳ සීමා නියම කිරීම. |
| ග | මෙම වගන්තියේ සඳහන් පුද්ගලයන් විසින් මුදල් සමාගමක කොටස් ප්‍රාග්ධනයෙන් දරනු ලැබිය හැකි උපරිම ප්‍රතිශතය. |
| ච | ඒ සමාගම් විසින්, සුරක්ෂණය කළ පහසුකම් සම්බන්ධයෙන් පවත්වාගෙන යා යුතු සීමා. |
| ට | මුදල් සමාගම්වල අධ්‍යක්ෂවරුන්ට හෝ සේවකයින්ට වැටුප්, දීමනා, වරප්‍රසාද, වියදම් ප්‍රතිපූරණ, සේවය අවසන් වීමේ දී ලැබෙන ප්‍රතිලාභ, පාරිතෝෂික සහ වෙනත් විශ්‍රාමික දීමනා ලෙස කරන ගෙවීම්. |
| ප | නිශ්චල දේපළ අත්කර ගැනීමේදී සහ ඒවා මිල කිරීමේදී මුදල් සමාගම් විසින් අනුගමනය කළ යුතු නියම, කොන්දේසි සහ පටිපාටීන්. |
| ම | මණ්ඩලය විසින් මේ පනත යටතේ පනවනු ලැබිය හැකි යම් දඩයක් ගෙවීම සහතික කිරීම සඳහා, මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි වටිනාකමකින් සහ නියම අනුව, මුදල් සමාගමක් විසින් බැංකු ඇපයක් ඉදිරිපත් කිරීම. |

***"පොදු ප්‍රවේශයක් අනුගමනය කිරීමෙන් මුදල් සමාගම්වල ව්‍යාපාර මෙහෙයුම් සඳහා*** විධානයන් ***නිකුත් කිරීම ඥානාන්විත නොවන බව සහ විවිධ අවදානම් කළමණාකරණ රාමු සහ ව්‍යාපාර ආකෘති සමග ක්‍රියාත්මක වන නිසා අදාළ සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලයට තීරණ ගැනීමේ බලය ලබා දී ඇති බව"*** මුදල් මණ්ඩලයේ ලේකම්වරයා විසින් මා දැනුවත් කරන ලදී.

**4.2 මතභේදයට තුඩු දෙන ගනුදෙනු**

---------------------------------------

මූල්‍ය වෙළඳපළේ පියවීමේ අවධානම අවම කිරීම සහ නිෂ්කාශන හා පියවීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා මධ්‍යම පාර්ශවිකරණ යාන්ත්‍රණය (**Central Counter Party Mechanism - CCP)** ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය උපදේශන හා ව්‍යාපෘති කළමනාකරණ සේවා ලබා ගැනීම සඳහා 2015 ජනවාරි මාසයේදි උපදේශක සමාගමක් පත් කර තිබුණි. බැංකුව,කොළඹ කොටස් වෙළඳපොළ සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිසම සභාව එක්ව එළඹෙන ලද ත්‍රෛපාර්ශවික ගිවිසුමක් අනුව උපදේශන ගාස්තුවද ඇතුලත්ව ව්‍යාපෘතියේ පිරිවැය ඔවුන් විසින් සම සමව දරණු ලබයි. ඒ අනුව, බැංකුව විසින් පළවන අදියරේ උපදේශන ගාස්තුවෙන් සිය කොටස වන රු.මිලියන 22.2 ක් ගෙවා තිබුණි. කෙසේවෙතත්, බැංකුව මෙම ත්‍රෛපාර්ශවික ගිවිසුමෙන් 2015 දී ඉවත් වී තිබු අතර, ව්‍යාපෘතියේ අනෙත් අදියර හතර අවසන්වීමෙන් තොරව ත්‍රෛපාර්ශවික ගිවිසුම අවසන් වී තිබුණි.

**4.3 ප්‍රසම්පාදනය සහ කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

----------------------------------------------

**4.3.1 ඇමරිකා එක්සත් ජනපදයේ සහ බ්‍රසීලයේ පිහිටි බැංකුව විසින් මිලදී ගන්නා ලද දේපළ**

----------------------------------------------------------------------------------------------

"බ්‍රසීලයෙහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහ එක්සත් ජනපදය, නිව්යෝර්ක් හි එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත කාර්යාලය සඳහා කාර්යාල මිලදී ගැනීමේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දරන ලද වියදම් පිළිබඳව සොයා බලා ඒ ඒ දේපළ සම්බන්ධව වෙන වෙනම වාර්තා කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව", **2017** පෙබරවාරි **09** වැනි දින පාර්ලිමේන්තුවේදී සම්මත කරන ලද යෝජනාවට අනුව **2017** මැයි **23** දින පත් කර තිබුණි.

ඉහත දේපළවල ඉඩම් අගය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසට මෙම කමිටුව විසින් විගණකාධිපතිවරයා වෙත උපදෙස් ලබා දි තිබු අතර ඒ අනුව 2017 සැප්තැම්බර් 20 දින කමිටුව වෙත වාර්තාවක් ඉදිරිපත් කරන ලදී. පසුව මෙම කමිටුව විසින් ඉහත විෂය සම්බන්ධයෙන් විමසන ලද කරුණු මත තවත් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසට විගණකාධිපතිවරයා වෙත උපදෙස් ලබා දි තිබු අතර එම වාර්තාව 2017 නොවැම්බර් 24 වන දින කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී. ඉහත සඳහන් වාර්තා වල ඇතුළත් ප්‍රධාන නිරීක්ෂණයන් පහත සඳහන්වේ.

(අ) විදේශ රටකින් දේපළ මිලදී ගැනීමේ හැකියාව පිළිබඳව සලකාබැලීම සඳහා සහ නිව්යෝර්ක් හි එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකා රාජ්‍ය ත්‍රාන්තික දූත මණ්ඩලයට කුලියට ලබා දීම සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ ලිඛිත ඉල්ලීම ලැබීමෙන් අනතුරුව සහ නිව්යෝර්ක් හි දේපළ මිලදී ගැනීම සඳහා වන නිර්දේශයන්, පත් කළ කණ්ඩායමෙන් ලබා ගැනීමෙන් අනතුරුව විදේශ රටකින් දේපළ මිලදී ගැනීම සඳහා වන මුදල් මණ්ඩලයේ අනුමැතිය ලබාදි තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) මුදල් නීති පනතේ **117** වන වගන්තියට අනුව ශ්‍රී ලංකා මහ බැංකුවට ස්වකීය හිමිකමක් සපුරා ගැනීමේදී අත්පත් කර ගන්නා සම්බන්ධතාවයක් හැර වෙළඳාමක හෝ වෙනත් ලෙසකින් වාණිජ, කාර්මික හෝ වෙනත් ව්‍යාපාර කටයුත්තක නියැලීම වළක්වා ඇත. බැංකුවේ අනාගත සිය භාවිතය සඳහා අවශ්‍ය වන තෙක් ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට, මිලදී ගන්නා ලද ගොඩනැඟිලි වෙළඳපළ අගයන්ට කුලියට ලබා දීමේ අරමුණින් තෝරාගත් ජාත්‍යන්තර

නගරවල කාර්යාල සඳහා සුදුසු ගොඩනැඟිලි මිලදී ගැනීම සඳහා වන මුදල් මණ්ඩලයේ තීරණය, දේපල කුලියට දීම අනිවාර්යයෙන්ම වාණිජ අත්පත් කර ගැනීමක ලක්ෂණ පැවතීම නිසා ඉහත අවශ්‍යතාවයන්ට පටහැනි විය.

(ඈ) 1949 අංක 58 දරණ මුදල් නීති පනතේ 5.9 (2) සහ 10 (ඈ) හි විධිවිධාන යටතේ නිශ්චල දේපලක් මිලදී ගැනීම සඳහා මුදල් මණ්ඩලය සතුව බලය ඇති බවට නීතිපතිවරයා විසින් 2016 පෙබරවාරි 25 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇත. කෙසේ වෙතත්, මෙම දේපල කුලියට දීම, මුදල් නීති පනතේ **117** වන වගන්තිය යටතේ දක්වා ඇති තහනමට යටත් වන බව තවදුරටත් දක්වා තිබුණි.

(ඈ) රජයේ ප්‍රධාන තක්සේරුකරුද ඇතුලත් කණ්ඩායමක් විසින් නිව්යෝක්හි දේපල මිලදී ගැනීම දැනට පවත්නා වෙන්කිරීම (Partitioning) හා ගෘහ භාණ්ඩ සහිතව ඇමෙරිකානු ඩොලර් මිලියන 5.25 ට වඩා වැඩි නොවන අර්පනයකට මිලදී ගැනීමට නිර්දේශ කර තිබු නමුත් නිව්යෝක්හි දේපල මිලදී ගත් අවස්ථාවට අදාළව වෙනමම තක්සේරු වාර්තාවක් ස්වාධීන තක්සේරුකරුවකුගෙන් ලබා ගෙන නොමැති බව නිරීක්ෂණය විය.

(ඉ) නිව්යෝක්හි පිහිටි දේපළ සම්බන්ධයෙන් 2010 සැප්තැම්බර් 10 දිනැති අංක ඒඩීඑම් / 57 දරන ලිපිය මගින් නිව්යෝර්ක් හි එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිතවරයා විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශයන් ඉහත කමිටුවේ වාර්තාවට ඇතුළත් කර තිබුණි. එම නිර්දේශයන්ට අනුව ගොඩනැඟිල්ල විශිෂ්ඨ තත්ත්වයක පැවති අතර අතිරේක වැසිකිළි දෙකක් ඉදි කිරීම හැර කිසිදු අභ්‍යන්තර ප්‍රතිනිර්මානයක් අවශ්‍ය නොවීය. කෙසේ වෙතත් ඉහත සඳහන් නිර්දේශ වලට ප්‍රතිවිරුද්ධව 2011 අප්‍රේල් 19 දිනැති එන්වයි/ඒඩීඑම්/57 දරණ ලිපියෙන් නිව්යෝර්ක් හි එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකා නියෝජ්‍ය නිත්‍ය නියෝජිතවරයා විසින් අතිරේක වැසිකිළි 3 ක් ඉදිකිරීම, බිම නැවත කාපට් කිරීම සහ ඇතැම් වෙන්කිරීම් වැඩ (Partitioning work) ආදී වූ වැඩි දියුණු කිරීම් සඳහා ඇමරිකානු ඩොලර් 400,000 ක පමණ අතිරේක මුදලක් ඉල්ලා තිබුණි. ඒ අනුව ඇමරිකානු ඩොලර් 395,000 ක මුදලක් වැඩි දියුණු කිරීම් සඳහා වැය කර තිබු අතර අතිරේක වැසිකිළි දෙකක් ඉදි කිරීමට අමතරව වෙනත් වැඩි දියුණු කිරීම් සිදු කර තිබුණි. (නව වැසිකිළි දෙකක් (2) ඉදිකිරීම සඳහා වූ වියදම ඇමරිකානු ඩොලර් 39,500 ක් විය).

බැංකුව විසින් බ්‍රසීලයේ හි හා නිව් යෝර්ක් හි පිහිටි දේපළ විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත පිළිවෙලින් 2018 මැයි 03 වන දින සහ 2018 මැයි 30 වන දින පවරා දී තිබුණි. දේපළවල සත්‍ය පිරිවැය වූ රු. මිලියන 734.3 ක් 2018 මාර්තු 28 වන දින 2017 වර්ෂයට අදාළව මහා භාණ්ඩාගාරය වෙත ලබා දිය යුතු ලාභ විසර්ජන වලින් පියවාගෙන තිබුණි.

### 4.3.2 පවිත්‍රතා සහ පිරිසිදු කිරීමේ සේවා සපයා ගැනීම සඳහා ප්‍රසම්පාදනය

පහත දැක්වෙන නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

(අ) පූර්ව කොන්ත්‍රාත් මිල වූ රු. 35,404,073 (වැට් හැර) න් සියයට 7.5 කින් කොන්ත්‍රාත් මිල වැඩි කිරීමට යටත්ව පිරිසිදු කිරීමේ සේවා සමාගමක් සමඟ අත්සන් කළ පූර්ව ගිවිසුම 2015 ඔක්තෝබර් 01 දින සිට 2017 සැප්තැම්බර් මස 30 වන දින දක්වා තවත් වසර දෙකක කාල සීමාව දක්වා දීර්ඝ කර තිබුණි. ඊට අමතරව බහු මහල් මෝටර් රථ නැවතුම් පළ පිරිසිදු කිරීමේ සහ පවිත්‍රතා සේවා සඳහා වූ කොන්ත්‍රාත්තුව ද වසර දෙකක කාල සීමාවක් සඳහා රු. 983,446 ක් (වැට් හැර) වූ වාර්ෂික කොන්ත්‍රාත් මිලකට එම සමාගමට ලබා දෙන ලදි. ඒ අනුව මුළු වාර්ෂික කොන්ත්‍රාත් මිල රු. 36,385,519 ක් (වැට් හැර) විය.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(i) ලංසු කැඳවීම සඳහා සහ නව කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීම සඳහා 2015 ජූලි 21 දින මහ බැංකු අධිපතිගේ අනුමතිය යටතේ ප්‍රසම්පාදන කමිටුවක් හා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කර තිබුණද, නව කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීම සඳහා මිල ගණන් කැඳවීමකින් තොරව කලින් සමාගම සමඟ පිරිසිදු කිරීමේ සේවා සඳහා පැවති කොන්ත්‍රාත් ගිවිසුම දීර්ඝ කර තිබුණි.

*''පූර්ව කොන්ත්‍රාත් ගිවිසුමේ දෙපාර්ශවය විසින් එකඟ වූ කොන්දේසි මත කල් ඉකුත්වීමේ දී එම කොන්ත්‍රාත්තුවම දීර්ඝ කිරීමේ විධිවිධාන අඩංගු වී තිබූ බව සහ වසර දෙකක ගිවිසුම් කාල සීමාවක් තුළ කොන්ත්‍රාත්තුව සමග සම්බන්ධිත වැටුප්, රසායනික ද්‍රව්‍ය සහ අනෙකුත් සම්පත් වල අගයන් වැඩිවීම මත සියයට 7.5 කින් කොන්ත්‍රාත් මිල වැඩිවීම සාධාරණ බව බැංකුවේ මතය වන බව''* බැංකුවේ මුදල් මණ්ඩලයේ ලේකම්වරයා විසින් මා දැනුවත් කරන ලදි.

(ii) ඉහත කොන්ත්‍රාත්තුවම රු. 18,193,760 ක් වූ (වැට් හැර) කොන්ත්‍රාත් මිලකට 2018 මාර්තු 31 වන දින දක්වා තවදුරටත් දීර්ඝ කර තිබුණි.

**(ආ)** විවෘත තරඟකාරී ලංසු කැඳවීමෙන් ලංසු කැඳවන ලද අතර, ලංසු ඇගයීමෙන් අනතුරුව, බැංකුවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල, බැංකු නිවස, මෝටර් රථ නැවතුම් පළ සහ ඔරලෝසු කුළුණ සඳහා පවිත්‍රතා සේවා සැපයීම සඳහා වූ කොන්ත්‍රාත්තුව, 2018 අප්‍රේල් 01 වන දින සිට ආරම්භවන වසර දෙකක කාලයක් සඳහා දෙවන අඩුම මිල වූ රු.129,188,389 ක් (වැට් හැර) ඉදිරිපත් කළ පෞද්ගලික සමාගමකට පිරිනමා තිබුණි.

බැංකුවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල, මෝටර් රථ නැවතුම් පළ, වැතම් වීදියේ ඔරලෝසු කුළුණ හා බැංකු නිවස සඳහා පවිත්‍රතා සේවා සැපයීම සඳහා වසරකට මුළු පිරිවැය ඇස්තමේන්තුව රු. මිලියන 41.46 ක් විය. කෙසේ වෙතත්, පිරිනමන ලද කොන්ත්‍රාත්තුවේ වාර්ෂික පිරිවැය රු. මිලියන 74.28 ක් (VAT ඇතුළුව) විය. එබැවින්, රු.මිලියන 32.82 ක හෙවත් සියයට 79 ක අසාමාන්‍ය පිරිවැය වැඩිවීමක් විගණනයේදි නිරීක්ෂණය විය.

### 4.3.3 2016 වර්ෂය සඳහා මුදල් කාසි ටංකනය කිරීම

2012 ජූනි 27 වැනි දින පවත්වන ලද රැස්වීමක දී අමාත්‍ය මණ්ඩලය විසින් කාසි ටංකනය කිරීම සඳහා ජාත්‍යන්තර මිල ගණන් කැඳවීම හෝ පවත්නා සැපයුම්කරුවන් වෙත ඇණවුම් ඉදිරිපත් කිරීම සම්බන්ධව අවසාන තීරණය ගැනීමට මුදල් මණ්ඩලය වෙත අධිකාරි බලය පවරා තිබුණි.

2015 ඔක්තෝබර් 31 වැනි දිනට තොග මට්ටම් සහ කාසිවල ඉහළ ඉල්ලුම සපුරාලීම සඳහා ඇති පොරොත්තු කාලය සැලකිල්ලට ගනිමින්, 2015 නොවැම්බර් 24 දින පැවති රැස්වීමකදී මුදල් මණ්ඩලය විසින් අමුද්‍රව්‍යවල මිල ගණන් 2013 වර්ෂයේ පැවැති මිල මට්ටම් වලට සාපේක්ෂව සැලකිය යුතු ලෙස අඩු වීම සැලකිල්ලට ගනිමින් ඇණවුම් ලබා දිය යුතු මිලගණන් කතිකා කර ගනිමින් දැනට පවත්නා සැපයුම්කරුවන් වෙත කාසි මිලියන 255 ක් ටංකනය කිරීමට ඇණවුම් ලබා දීම අනුමත කර තිබුණි.

පහත සඳහන් නිරීක්ෂණ මේ සම්බන්ධයෙන් සිදු කරනු ලැබේ.

අ) 2013 - 2015 කාලපරිච්ඡේදය සඳහා බැංකුව වෙත කාසි මිලියන 550 ක් ටංකනය කිරීම සහ සැපයීම සඳහා ජාත්‍යාන්තර මිල ගණන් කැඳවනු ලැබූ අතර සැපයුම්කරුවන් තුන්දෙනෙකු වෙත කොන්ත්‍රාත්තු පිරිනමා තිබුණි. පිරිනමන ලද කොන්ත්‍රාත්තුව 2013 -2015 කාලපරිච්ඡේදය සඳහා පමණක් බැවින් 2016 වර්ෂය සහ ඉදිරි කාලපරිච්ඡේදයන් සඳහා කාසි අවශ්‍යතාව සඳහා ජාත්‍යාන්තර මිල ගණන් කැඳවීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය සුදුසු අවස්ථාවේදී ආරම්භ කළ

යුතුව තිබුණි. කෙසේ වුවද 2015 ඔක්තෝබර් 31 වන දිනට වූ තොග මට්ටම් සහ කාසිවල ඉහළ ඉල්ලුම සපුරාලීම සඳහා ඇති පොරොත්තු කාලය ඉස්මතු කරමින් 2013 වර්ෂයේදී ඉදිරිපත් කරන ලද මිල ගණන් මත පදනම්ව කතිකා කරගන්නා මිල ගණන්වලට පවත්නා සැපයුම්කරුවන් වෙත 2016 වර්ෂය සඳහා කාසි ටංකනය කිරීමට ඇණවුම් ලබා දීම සඳහා වූ මුදල් මණ්ඩලයේ අනුමැතිය 2015 නොවැම්බර් 11 වන දින ඉල්ලා තිබුණි.

ආ) පවත්නා සැපයුම්කරුවකු විසින් රු. 1 සහ රු. 5 කාසි සඳහා ඉහල මිල ගණන් ඉදිරිපත් කිරීම නිසා, 2016 වසර සඳහා රු. 5 කාසි ටංකනය කිරීමේ මිල ගණන් 2013 වසරේ මිල ගණන් වලට සාපේක්ෂව කාසි 1000 ක් සඳහා ඇමරිකානු ඩොලර් 5.25 කින් වැඩි වී තිබුණි. එබැවින් රු. 5 කාසි සඳහා ඇණවුම මිලියන 40 දක්වා අඩු කිරීමටත් රු. 1 කාසි සඳහා ඇණවුම් නොකිරීමටත් මුදල් මණ්ඩල තිරණය කර තිබුණි.

ඇ) 2015 නොවැම්බර් 24 දිනැති මුදල් මණ්ඩලය විසින් තීරණයේ සඳහන් පරිදි, 2013 වර්ෂයේ පැවති මිල මට්ටම් සමග සැසඳීමේ දී අමුද්‍රව්‍යවල මිල ගණන් සැලකිය යුතු ලෙස පහත වැටී තිබුණි. කෙසේවෙතත්, පවත්නා සැපයුම්කරුවන්ගෙන් පමණක් කාසි ටංකනය කිරීම සඳහා මිල ගණන් ලබා ගැනීම නිසා අමුද්‍රව්‍යවල මිල ගණන් අඩු වීමේ වැඩි වාසි බැංකුව වෙත ලැබී නොතිබුණි. අනෙක් අතට, පවත්නා සැපයුම්කරුවන්ගෙන් පමණක් කාසි ටංකනය කිරීම සඳහා මිල ගණන් ලබා ගැනීම නිසා සැපයුම්කරුවන් අතර තරඟකාරිත්වයක් ඇති කිරීමේ අවස්ථාව අහිමි වී තිබුණි. කාසි ටංකනය කිරීමේ පිරිවැයෙන් සාමාන්‍යයෙන් සියයට 42 සිට සියයට 68 දක්වා ලෝහ පිරිවැය නියෝජනය වන බව තවදුරටත් නිරීක්ෂණය විය.

ඉ) තෝරාගත් ලංසුකරු විසින් රු. 2 සහ රු. 10 කාසි සඳහා (2016 මාර්තු 08 දින 2016 වර්ෂයේ කාසි අවශ්‍යතාවයේ ඉතිරි කොටස සඳහා දැනට පවත්නා සියළුම සැපයුම්කරුවන්ගෙන් කැඳවා තිබුණු නව මිළ ගණන් මත) ඉදිරිපත් කරන ලද මිළ ගණන් ඉහත සඳහන් පවත්නා සැපයුම්කරුවන් විසින් 2015 දෙසැම්බර් 02 වන දින ඉදිරිපත් කරන ලද මිළ ගණන් සමඟ සංසන්දනය කිරීමේදි සැලකිය යුතු ලෙස පහත වැටී තිබුණි. රු. 2 සහ රු. 10 කාසි 1000 ක් සඳහා පිළිවෙලින් ඇමරිකානු ඩොලර් 5.21 ක් හා ඇමරිකානු ඩොලර් 1.13 ක් බැගින් අඩු වී තිබුණි.

## 4.4 පූර්ව විගණන වාර්තා තුළින් පෙන්වා දුන් නොවිසඳුනු කරුණු

මාගේ පසුගිය විගණන වාර්තා තුළින් පෙන්වා දුන් කරුණු කිහිපයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විසඳී නොතිබුණි. විස්තර පහත දැක්වේ.

### (අ) බැංකුවේ ගොඩනැගිලි කුලියට දීම

මුදල් නීති පනතේ **117** වන වගන්තියට අනුව, "බැංකුව ස්වකීය හිමිකමක් සපුරා ගැනීමේදී අත්පත් කර ගන්නා සම්බන්ධතාවයක් හැර වෙළඳාමක හෝ වෙනත් ලෙසකින් වාණිජ, කාර්මික හෝ වෙනත් ව්‍යාපාර කටයුත්තක නියැලිය නොයුතුය". මෙම විධිවිධානයට පටහැනිව**,** බැංකුවට අයත් පහත සඳහන් ගොඩනැගිලි අපේක්ෂිත අරමුණු සඳහා යොදා නොගෙන බාහිර පාර්ශවයන් වෙත කුලියට ලබාදී තිබූ අතර බැංකුව විසින් කුලී ආදායම ලෙස රු. **476,**418,155 ක් සමාලෝචිත වර්ෂය තුළ දී උපයා තිබුණි. විස්තර පහත සඳහන් වේ.

| දේපළේ නම | කුලියට දී තිබූ කාලපරිච්ඡේදය | බදු කරුගේ නම | මාසික කුලිය |
|---|---|---|---|
| සෙන්ට්‍රල් පොයින්ට් ගොඩනැගිල්ල (බිම් මහලෙහි කොටසක්, 2 වන සහ 3 වන මහල) | **2016** නොවැම්බර් **27** සිට **2017** නොවැම්බර් **26** දක්වා | මූල්‍ය අපරාධ විමර්ශන අංශය - ශ්‍රී ලංකා පොලීසිය | රු **.2,600,000** |
| බැංකුවේ ප්‍රධාන කාර්යාලය (4 වන සහ 5 වන කුළුනේ 12 වන මහල) | **2016** නොවැම්බර් **28** සිට **2018** නොවැම්බර් 27 දක්වා | සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව | රු **.1,654,000** |
| බැංකුවේ ප්‍රධාන කාර්යාලය (3 වන සහ 5 වන කුළුනේ 5 වන මහල සහ 1 වන කුළුනේ 1 වන මහල) | **2016** ජනවාරි **01** සිට **2017** දෙසැම්බර් **31** දක්වා | සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව | රු.3,213,860 |
| ලොයිඩ් ගොඩනැගිල්ල | **2016** ජනවාරි **01** සිට **2017** දෙසැම්බර් **31** දක්වා | සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව | රු. 6,752,500 |
| සෙන්ට්‍රල් පොයින්ට් ගොඩනැගිල්ල (4 වන සහ 5 වන මහල) | **2016** දෙසැම්බර් **01** සිට 2017 නොවැම්බර් **30** දක්වා සහ 2018 නොවැම්බර් 01 | වෙක් පෝට් සිටි කොළඹ **සමාගම (පුද්ගලික)** | රු **.5**,540,658 (පළමු වසර) රු.**5**,956,218 (දෙවන වසර) |
| බැංකුවේ ප්‍රධාන කාර්යාලය (5 වන කුළුනේ 15 වන සහ 16 වන මහල) | **2016** දෙසැම්බර් **01** සිට **2018** නොවැම්බර් **30** දක්වා | ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව, ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය | රු **.2,141,480** |
| බැංකු අධ්‍යයන මධ්‍යස්ථානය - **රාජගිරිය (නේවාසික කොටස)** | **2016** ජූලි **01** සිට **2018** ජූනි 30 දක්වා | ශ්‍රී ලංකා විශේෂ කාර්ය බලකාය | රු **.220,000** |
| අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලයේ කොටසක් | **2016** සැප්තැම්බර් **03** සිට **2018** මාර්තු **02** දක්වා | **ඒබී සිකියුරිටීස් පුද්ගලික සමාගම** | රු **.230,000** |
| වයිට්වේස් ගොඩනැගිල්ල - දෙවන මහල | **2015** නොවැම්බර් **01** සිට **2018** ඔක්තෝබර් 31 **දක්වා** | නීතිය සහ සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය | රු **.2,070,000** |

| | | | |
|---|---|---|---|
| වයිට්වේස් ගොඩනැගිල්ල - බිම් මහල | **2015** නොවැම්බර් **01** සිට **2018** ඔක්තෝබර් 31 දක්වා | ණය තොරතුරු කාර්යාංශය | රු **.4,140,000** |
| මාතර ප්‍රාදේශීය කාර්යාලයේ කොටසක් | **2014** සැප්තැම්බර් 15 සිට **2018** මාර්තු 14 දක්වා | ඒබී සිකියුරිටීස් **පුද්ගලික සමාගම** | රු **.265,816** / 2017.09.15 සිට රු. 332,270 |
| බ්‍රසීලයෙහි පිහිටි දේපළ | **2015** පෙබරවාරි **01** සිට 2017 දෙසැම්බර් **31** දක්වා | විදේශ කටයුතු අමාත්‍යාංශය | ඇ.ඩොලර් **9,000** |
| නිව්යෝර්ක්හි පිහිටි දේපළ - යුඑස්ඒ | **2015** ජූනි **01** සිට 2017 දෙසැම්බර් **31** දක්වා | විදේශ කටයුතු අමාත්‍යාංශය | ඇ. ඩොලර් **68,000** |

බ්‍රසීලයෙහි හා නිව්යෝර්ක්හි පිහිටි දේපළ එහි වෙළඳපොළ වටිනාකමට රජය වෙත පැවරීමට බැංකුවේ මුදල් මණ්ඩලය විසින් 2016 මැයි 10 වන දින තීරණය කර තිබුණි. එම දේපළ වෙනුවෙන් බැංකුව විසින් වැය කර තිබූ සත්‍ය පිරිවැය වූ රු. මිලියන 734.3 කට විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නමට දේපළ පැවරීම සඳහා කටයුතු කරන ලෙසට 2016 නොවැම්බර් 23 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමතිය ලබා දෙන ලදී. බ්‍රසීලයෙහි හා නිව්යෝර්ක්හි පිහිටි දේපළ පැවරීමේ ඔප්පු සඳහා පිළිවෙලින් 2018 මැයි 03 වන දින සහ 2018 මැයි 30 වන දින අත්සන් කරන ලදී. මුළු සත්‍ය පිරිවැය වූ රු. මිලියන 734.3 ක් 2018 මාර්තු 28 වන දින 2017 වර්ෂයට අදාළ ලාභ විසර්ජන වලින් පියවාගෙන තිබුණි.

**(ආ)** දෝෂ සහිත ක්‍රියාමාර්ග

ප්‍රාථමික අලෙවිකරුවෙකු සමඟ බැංකුව විසින් සිය අරමුදල් වෙළඳාම් කළ හැකි ප්‍රතිවර්ත ප්‍රතිමිලදී ගැනීම් **(Tradable Reverse Repo)** ආයෝජනවල ආයෝජනය කර තිබුණි. ආපසු ගන්නා සුරැකුම්පත් සම්බන්ධයෙන් කිසිදු සුරැකුම් යළි පැවරීමෙන් තොරව පාදක වූ සුරැකුම්පත් ප්‍රාථමික ගනුදෙනුකරු විසින් ආපසු ගැනීම හේතුවෙන් මෙම ආයෝජනයන් සම්බන්ධයෙන් ලංකා සිකියුර් සිස්ටම් **(Lanka Secure System)** හි ශුන්‍ය ශේෂයක් දක්වා තිබුණි. **2015** දෙසැම්බර් **04** දින ගන්නා ලද මුදල් මණ්ඩල තීරණය ප්‍රකාරව, සහතික ඇප නොමැතිව ඉහත සඳහන් ආයෝජනය යළි යළි ආයෝජනය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය තීරණය කර තිබුණි. මෙම ප්‍රාථමික ගනුදෙනුකරු සමඟ බැංකුවේ අරමුදල් මගින් සහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන අරමුදල් මගින් කරන ලද සහතික ඇප නොමැති ප්‍රතිමිල දී ගැනුම් ආයෝජන වටිනාකම රු. බිලියන **2.4** ක් විය.

බැංකුව විසින් **2012** දෙසැම්බර් **10** සහ **14** දින වලදී පවත්වන ලද පරීක්ෂණවලදී අනාවරණය කර ගන්නා ලද උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් (ඇතැම් ආයෝජකයන්ට ප්‍රමාණවත් සුරැකුම්පත් වෙන් නොකිරීම සහ දිනය තුළ ද්‍රවශීලතා පහසුකම් ලබාගැනීම **(ILF)** සඳහා ආයෝජකයන්ගේ සුරැකුම්පත් භාවිතා කිරීම) ඉහත ප්‍රාථමික ගනුදෙනුකරු වෙත අවවාදාත්මක ලිපි කිහිපයක් සහ 2013 ජූනි 06 දින නියෝගයක් ද නිකුත් කර තිබිය දී, මෙම ප්‍රාථමික ගනුදෙනුකරුගේ ඉහත දෝෂ සහිත ක්‍රියාවන් සඳහා බැංකුව විසින් නිසි ක්‍රියාමාර්ග නොගැනීම නිසා 2015 වර්ෂයේ දී මෙම ප්‍රාථමික ගනුදෙනුකරු විසින් නැවතත් එවැනි දෝෂ සහිත ක්‍රියාවන් සිදු කර තිබිණි. තවද, බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ අංශය විසින් **2015** මැයි **20** සහ **21** දින වලදී **2015** මාර්තු **31** දිනට ප්‍රාථමික ගනුදෙනුකරු පිළිබඳව ස්ථානීය පරීක්ෂණයක් සිදු කර තිබුණි. ඉහත සඳහන් උල්ලංඝනයන්

ඇතුළුව විවිධ රෙගුලාසි සහ නිර්දේශ උල්ලංඝනය කිරීම් ඉහත සඳහන් ස්ථානීය පරීක්ෂණය තුළ දී නිරීක්ෂණය වී තිබුණි.

ඉන් අනතුරුව, මුදල් මණ්ඩලය විසින් **2017** ජනවාරි **30** දින පැවති අංක **3/2017** දරණ රැස්වීමේදී තීරණය කරන ලද පරිදි, මහ බැංකු අධිපතිවරයා විසින් ඉහත සඳහන් ප්‍රාථමික ගනුදෙනුකරු සම්බන්ධව බැංකුවේ ක්‍රියාමාර්ග සහ මෙහෙයුම් පිළිබඳව පරීක්ෂණයක් පවත්වා වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා කමිටුවක් පත් කර තිබුණි. පරීක්ෂණය සිදු කිරීමෙන් අනතුරුව, කාලසීමාව පුරාම සහනදායි අධීක්ෂණයක් පැවති බව සහ සමහර අවස්ථාවන්හි දී සියළු වාර්තාකරණ මට්ටම් වලදී විචක්ෂණශීලී ආයෝජන තීරණයන් ස්ථිරවම ගෙන නොමැති බවට වූ නිගමනයන්ට කමිටුව විසින් එළඹී තිබුණි.

## 5. තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක්ම ක්‍රියාකළ යුතුය. කෙසේවෙතත්, බැංකුවේ විෂය පථයට අනුකූලව තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට බැංකුව විසින් කටයුතු කර නොතිබුණි.

***"තිරසාර සංවර්ධන අරමුණු ඍජු ලෙස සපුරා ගැනීමට උපකාර කිරීමට නීත්‍යානුකූල බලතල හෝ මෙවලම් බැංකුව සතු නොවන බව සහ තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීම සඳහා බැංකුවේ අරමුදල් යොදාගත නොහැකි බව***" බැංකුවේ මුදල් මණ්ඩලයේ ලේකම්වරයා විසින් මා දැනුවත් කරන ලදි.

## 6. පද්ධති සහ පාලන

විගණනයේදී නිරීක්ෂණය කරන ලද පද්ධති හා පාලනවල අඩුපාඩු වරින් වර බැංකු අධිපතිවරයා වෙත දැනුම් දී ඇත. පහත දැක්වෙන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු විය යුතු වේ.

| | පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණය |
|---|---|---|
| අ) | බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණය | ප්‍රාථමික ගනුදෙනුකරුවන් විසින් නීති රීති උල්ලංඝනය කිරීම |
| ආ) | භාණ්ඩාගාර බිල්පත් කළඹ නඩත්තු කිරීම | නිසි පරිදි නිර්මාණය කර ඇති පද්ධති ක්‍රියාකාරීත්වයක් වෙනුවට එක්සෙල් සීට් (Excel Sheet) භාවිතා කරමින් ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් වලට අයත් භාණ්ඩාගාර බිල්පත් කළඹ නඩත්තු කරනු ලබයි. |
| ඇ) | තොග පාලනය | (i) තොග ඇගයීම සඳහා ඉහළ මානව දෝෂ වලට ඉඩ ඇති අතින් සැකසූ බර තැබූ සාමාන්‍ය ක්‍රමවේදය භාවිතා කරනු ලබයි.<br>ii) සෙමින් චලනය වන සහ කල් ඉකුත්වූ තොග අයිතම හඳුනා ගැනීම සම්බන්ධයෙන් අනුමත ප්‍රතිපත්තියක් නොමැති වීම. |
| ඇ) | සයිබර් ආරක්ෂක පාලන රාමුව | බැංකුව කිසියම් සයිබර් ආරක්ෂණ පාලන රාමුවක් ලේඛණගත කර / නියම කර නොතිබුණි. |
| ඉ) | ගිණුම්කරණය | පරිපාලක විසින් iGLAS පද්ධතියේ ශේෂයන් සමඟ ලෙජර් ගිණුම් නිෂ්ක්‍රීය කිරීමට සහ නිෂ්ක්‍රීය වූ ලෙජර් ගිණුම් ශේෂ පිරික්සුමට ඇතුළත් නොකිරීමට හැකියාව පවතී . |